01) පාඩම හෝ ඒකකය - 6.1.2. සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ සිතුවම් අගයමු

02) ඉගෙනුම් එල -

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- නව නිර්මාණාත්මක සිතුවම් ශෛලිය සඳහා පදනම් වූ ආභාසය විමසා බලයි.
- නිර්මාණ සඳහා පදනම් වු චිත්‍ර මූලිකාංග හා සංරචන සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ රස විඳිමින් ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ චිත්‍ර දැක්වෙන ඡායාරූප හා වීඩියෝ පට නරඹන්න.
- ඔබ විසින් සොයා ගත් නිදර්ශන චිත්‍ර පිළිබඳ අවධානයට යොමු කරන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**කාර්ය පත්‍රිකාව**

1) සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

2) සෝලියස් මෙන්ඩිස් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

3) පහත සඳහන් කරුණු යටතේ සෝලියස් මෙන්ඩිස්ගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

- තේමාව
- ශෛලිය
- අභාසය
- ශිල්ප ක්‍රමය
- කලා ලක්ෂණ(රූප භාවිතය/ වර්ණ භාවිතය/ තලය භාවිතය)

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/0mTU6zLRX3E
  https://youtu.be/5EazGlsRjwc
  https://youtu.be/sduLesNW5VI
  https://youtu.be/-kJTbWjXCSw
  https://youtu.be/ZJtNTvI2WJ4
- කියවීම් පත්‍රිකාව -

- කැලණි විහාර බිතු සිතුවම් නව බෞද්ධ විහාර චිත්‍ර ශෛලියක් හඳුන්වා දීමට පුරෝගාමී විය.
- කැලණි විහාරයේ සිතුවම් නිර්මාණය කිරීමට ආභාසය වී ඇත්තේ, ඉන්දියාවේ අජන්තා, එල්ලෝරා හා භාග් වැනි ස්ථානවල කලා නිර්මාණ හා ලංකාවේ සීගිරිය, තිවංක පිළිමගේ වැනි ඉපැරණි සිතුවම් නිර්මාණයන් ය.
- කැලණි විහාරයේ සිතුවම්වලට අමතරව රණස්ගල්ල විහාරය, ගිරිඋල්ල මැද්දෙපොළ විහාරය, හබරාදූව පිටිදූව කැලණිගොඩ විහාරය, සහ පොළොන්නරුව ශ්‍රී විජය විහාරය යන විහාරස්ථානවල ද සෝලියස් මෙන්ඩිස් සිතුවම් ඇඳ ඇත.
- නව කැලණි විහාරයේ බිතු සිතුවම් තේමාත්මකව කොටස් දෙකකි.
  - ✓ **බුද්ධ චරිතයේ විවිධ අවස්ථා** - මහමායා දේවිය දුටු සිහිනය, වප් මඟුල, සිප් සතර හැදෑරීම, සුජාතාවගේ කිරිපිඬු දානය, සම්බුද්ධත්වයට පත්වීම, සම්බුද්ධ පරිනිර්වාණය
  - ✓ **ඓතිහාසික සිද්ධි** - විජය කුමරුගේ ලංකාගමනය, අනුරාධපුර මහාසීමාව බැඳීම, අළුවිහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, හේමමාලි කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළඳා වහන්සේ ලක්දිවට වැඩම කරවීම, සංඝමිත්තා තෙරණියෝ ශ්‍රී මහබෝධි අංකුරය ලක්දිවට වැඩම කරවීම.

05) අතිරේක පොත්/සඟරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**